## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත කුලී ගෙවීමේ පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම.

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයෙහි රාජකාරි නියුතු නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් සඳහා යුද්ධ හමුදා මූලස්ථානය අවට්න් පහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුව ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා විවෘත ලංසු කැඳවීමයි.

අ. **නිලධාරි නවාතැන් පහසුකම් සඳහා**

- ❖ එක් කාමරයක අවම වශයෙන් වර්ග අඩි 195ක් (දිග අඩි 15 × පළල අඩි 13) පමණ වන යාබඳ නාන කාමරයන් හා සියළුම යටිතල පහසුකම් සහිත නිලධාරින් 25ක් සඳහා නේවාසික පහසුකම් ලබා ගැනීමට සුදුසු ගොඩනැගිල්ලක්.
- ❖ එකවර පුද්ගලයින් 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට ආහාර ලබාගත හැකි භෝජනාගාරයකින් සමන්විත වීම.
- ❖ මල අපද්‍රව්‍ය, වැසි ජලය සහ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අනුමත ක්‍රමවේදයන්ට අනුව සකස් කරන ලද නළ/කාණු පද්ධති තිබීම.
- ❖ විසිත්ත කාමර නිදන කාමර වශයෙන් නවීකරණය කර නොතිබිය යුතුය.
- ❖ පුද්ගලයින් 25 කට පමණ ආහාර පිසීමේ පහසුකම් සහිත මුළුතැන්ගෙයකින් සමන්විත වීම.
- ❖ අවම වශයෙන් සැහැල්ලු වාහන 10 ක් ගාල්කර තැබීමට අවශ්‍ය ඉඩ පහසුකම් වලින් සමන්විත වීම.
- ❖ ආරක්ෂිත වැට/තාප්පයකින් සමන්විත වීම.
- ❖ තෙකලා විදුලිය සහ නළ ජල පහසුකම් වලින් සමන්විත වීම.
- ❖ විදුලි විසන්ධිවීමකදි සම්පූර්ණ ගොඩනැගිල්ලටම විදුලිය සැපයීම සඳහා විදුලි ජනක යන්ත්‍රයකින් සමන්විත වීම.
- ❖ කාර්ය මණ්ඩලයේ 25 ක් සඳහා නවාතැන් පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් වලින් සමන්විත වීම.

2. සියළුම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභා/ නගර සභා/ මහනගර සභා හෝ පළාත් සභා වෙතින් අනුමැතිය ලබාගෙන අංග සම්පූර්ණ ලෙස නිමකර තිබිය යුතුය.

3. අයදුම්කරුවන් හට ගොඩනැගිල්ලකට හෝ ගොඩනැගිලි කිහිපයක් සඳහා ලංසු ඉදිරිපත් කල හැක.

4. මාසික ජල/විදුලි බිල්පත් යුද්ධ හමුදාව වෙතින් නිරවුල් කරනු ලැබේ.

5. සියළුම ලංසු මුද්‍රා තබන ලද ලියුම් කවර වල බහා ප්‍රසම්පාදන කමිටු සභාපති, යුද්ධ හමුදා මූලස්ථානය, යුද්ධ හමුදා මූලස්ථාන රථගාල, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ යන ලිපිනය සඳහන් කර සතියේ දිනවල පෙරවරු 0830 පැයේ සිට පස්වරු 0400 පැය දක්වා කාලය තුළ ඉහත ලිපිනයේ පිහිටි ස්ථානයේ තබා ඇති "ගොඩනැගිලි බදු ගැනීම සඳහා ටෙන්ඩර්පත්" යනුවෙන් සඳහන් පෙට්ටිය තුළට බහාලීමට කටයුතු කල යුතුය. එම ලියුම් කවර වල වම්පස ඉහළ කෙළවරේ "ගොඩනැගිලි බදුදීම" ලෙස සටහන් කල යුතුය.

6. ටෙන්ඩරය 2024.09.24 වන දින පෙරවරු 1100 පැයට යුද්ධ හමුදා මූලස්ථානය, යුද්ධ හමුදා මූලස්ථාන රථගාල, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ යන ස්ථානයේදී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී ගොඩනැගිලි සබැඳිව පහත සඳහන් විස්තර ඇතුලත්විය යුතුය.

- ගොඩනැගිල්ලේ ලිපිනය.
- නීත්‍යානුකූල හිමිකරුගේ/ආයතනයේ නම සහ දුරකතන අංකය.
- ඔප්පු පිටපත හෝ හිමිකම් සහතිකය.
- මාස 06 ක් ඇතුලත ලබාගත් හිමිකම් වාර්තාව.
- රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ගොඩනැගිල්ල කුලියට ලබාදීම සඳහා ලබාගත් තක්සේරු වාර්තාව.
- ගොඩනැගිල්ලේ සැළැස්ම.
- අනුකූලතා සහතික ආදී ලේඛණ.
- සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ විස්තරය.
- වර්ග අඩි ප්‍රමාණය. (මහල් ගොඩනැගිල්ලක් නම් මහල් වශයෙන් වෙන් වෙන්ව)
- බලාපොරොත්තු වන මාසික කුලිය.
- ගොඩනැගිල්ල පිළිබදව පැහැදිලි අදහසක් ගතහැකි වන පරිදි ලබාගත් වර්ණ ඡායාරූප.
- ගොඩනැගිල්ලට අදාළ අනෙකුත් විස්තර.
- ගොඩනැගිල්ලට පිටතින් ඇති මාර්ගයේ දළ සටහන සමග ගූගල් ඡායාරූප.

8. ගොඩනැගිලි වල අයිතිය අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයා සතු වියයුතු අතර, එසේ නොමැතිනම් ඇටෝර්නි බලපත්‍ර හිමිකරුවෙකු වි යුතුය.

9. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන්පත සඳහා රජයේ තක්සේරු වටිනාකම් වාර්තාව මත කුලී මුදල් තීරණය වේ.

10. අදාළ ගොඩනැගිලි තෝරා ගැනීම ස්ථානීය පරික්ෂාවකින් අනතුරුව සිදු කරනු ලැබේ.

විශේෂ උපදෙස්

අ. නවාතැන් පහසුකම් සඳහා තෝරා ගනු ලබන ස්ථානයන්හී නවීකරණ කටයුතු හෝ වෙනසක් කිරීමට සිදුවුවහොත් එය හිමිකාර පාර්ශවය විසින් සිදුකල යුතුවේ.

ආ. මිලගණන් පත් පිටපත් 03 කින් ඉදිරිපත් කල යුතුවේ. (මුල් පිටපත සහ අනු පිටපත් 02 ක් වශයෙන්)

ඇ. විවෘත කරන දින අදාළ වේලාවෙන් පසු ලැබෙන මිල ගණන්පත් ප්‍රමාද මිල ගණන්පත් සේ සළකා විවෘත කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

<u>**වැඩි විස්තර සඳහා විමසීම්**</u>

කර්නල් (ඉඩම්, දේපළ හා හට නිවාස) - 076 5303695
කාර්යාල දුරකථන අංකය/ෆැක්ස් අංකය - 011 2388760